ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2022 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහෝ විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි. ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## <u>A කොටස</u>

### ප්‍රශ්න අංක 01

සමස්ථයක් ලෙස ආර්ථික විද්‍යා විෂයෙහි පුළුල් කොටසක් ආවරණය වන පරිදි මෙම කොටස සකස් වී ඇත. මූලික ආර්ථික විද්‍යාත්මකව න්‍යායන් හා සංකල්ප පදනම් වන අයුරින් මෙම කොටස සකස් කර ඇත.

ප්‍රශ්න අංක 1.1 සිට 1.10 දක්වා, දෙන ලද වරණ වලින් නිවැරදි පිළිතුරු තේරීමත්, ප්‍රශ්න අංක 1.11 සිට 1.12 දක්වා දෙන ලද පිළිතුරු දෙකෙන් නිවැරදි පිළිතුර ලිවීමටත්, ප්‍රශ්න අංක 1.13 සිට 1.15 දක්වා දෙන ලද ප්‍රකාශයන් සත්‍යද අසත්‍ය ද යන බව ප්‍රකාශ කිරීමටත්, ප්‍රශ්න අංක 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයීමක් සඳහා මෙම කොටස මඟින් අපේක්ෂා කෙරේ.

<u>**ප්‍රශ්න අංක** 1.1 -1.10 **දක්වා**</u>

**1.1** මූලික ආර්ථික සංකල්පයක් වන හිඟකම හා සම්බන්ධව අසා තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**1.2** නිෂ්පාදන සම්පත් සම්බන්ධයෙන් දැනුම පරීක්ෂා කිරීමට,ප්‍රාග්ධනය සඳහා ඇති ප්‍රතිලාභය කුමක්දැයි යන්න මෙමගින් විමසා තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් "පොලිය" ලෙස නිවැරදිව දක්වා තිබුණි.

**1.3** මුදලට ඇති ඉල්ලුම සඳහා හේතුවක් නොවන්නේ ආදේශක චේතනාව බව අයදුම්කරුවන් වැඩි දෙනෙක් සොයාගෙන තිබුණි.

**1.4** ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට අසා තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණද සමහර අයදුම්කරුවන් පූර්ණ අනම්‍ය සහ අනම්‍ය සංකල්ප පටලවාගෙන තිබුණි.

**1.5** උපේක්ෂා වක්‍ර විග්‍රහය ඇසුරින් අසා තිබූ මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි.

**1.6** මහ බැංකු වාර්තාව ඇසුරෙන් 2020 වසරේ ඒකපුද්ගල ආදායම පිළිබඳ ඇසූ ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි.

**1.7** ඍජු පිරිවැය සමම්බන්ධව අසා තිබූ මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර "ද්‍රව්‍ය පිරිවැය" ලෙස බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

**1.8** මානව සංවර්ධනයේ පැතිකඩ පිළිබඳ දැනුම මද බව බොහෝ අයදුම්කරුවන්ගේ අසාර්ථක පිළිතුරු ඇසුරෙන් කැපී පෙනුණි.

**1.9** මූල්‍ය අතරමැදියන් පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්නයට සැපයූ පිළිතුරු ඇසුරෙන් අවබෝධ වනුයේ ඒ පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම අඩු බවය.

**1.10** නිෂ්පාදන පිරිවැය ඇසුරෙන් අසා ඇති මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සැපයීමට අයදුම්කරුවන්ට නොහැකි වී තිබුණි. ඊට හේතුව පිරිවැය විග්‍රහයේ සැම සංකල්පයක් පිළිබඳවම පුළුල් අවබෝධයක්, මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සැපයීමට අවශ්‍ය වීමය.

**1.11 සහ 1.12**

දී ඇති පිළිතුරු දෙක ඇසුරෙන් නිවැරදි පිළිතුර තේරීමට දී තිබූ මෙම ප්‍රශ්න දෙකට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. ඒකාධිකාරී තරඟ වෙළඳපොළ හා මුදලේ වටිනාකම පිළිබඳ දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කර තිබුණි.

**1.13 සිට 1.15**

සත්‍ය අසත්‍ය බව විමසා තිබූ මෙම ගැටළුවට බොහෝ සිසුන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. මෙහිදී කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය, හීනවන ආන්තික ඵලදා න්‍යාය සහ සැපයුම් නීතිය පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලදී.

**1.16 සිට 1.20** දක්වා ප්‍රශ්නවලට අයදුම්කරුවන් විසින් කෙටි පිළිතුරු සැපයිය යුතුවිය.

**1.16** ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමට බලපාන සාධක දෙකක් සඳහන් කළ යුතු විය. මෙයට බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. නමුත් අතලොස්සක් අයදුම්කරුවන් ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට බලපාන සාධක දක්වා තිබුණි.

**1.17** කතිපයාධිකාරී වෙළඳපොලක ලක්ෂණ විමසා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් වෙළඳපොල වර්ග පටලවාගෙන අනෙකුත් වෙළඳපොල වර්ගයන්හි ලක්ෂණ ද දක්වා තිබුණි.

**1.18** ඉල්ලුම වෙනස්වීම පිළිබඳ විමසා තිබුණි. එනම්, ඉල්ලුම්වක්‍රය දකුණට හෝ වමට විතැන් වීමයි. කෙසේ නමුත් ඇතැම් අයදුම්කරුවන් ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම, නොහොත් ඉල්ලුම් වක්‍රය හරහා ගමන් කිරීම පිළිබඳව පැහැදිලි කර තිබුණි.

**1.19** නිෂ්පාදන ක්‍රියාවලියේ දිගුකාලීන නිෂ්පාදනය පිළිබඳව විමසා තිබුණි. කෙසේවෙතත්, දිගුකාලය යනු සියළුම නිෂ්පාදන සාධක, විචල්‍ය සාධක බවට පත්වන කාලය ලෙස නිවැරදිව හඳුනාගෙන තිබුණේ අයදුම්කරුවන්ගෙන් කීපදෙනෙක් පමණි.

**1.20** ජාතික ආදායමේ වෘත්තාකාර ප්‍රවාහයේ කාන්දුවීම් සඳහා උදාහරණ, අයදුම්කරුවන් බහුතරය නිවැරදිව දක්වා මුළු ලකුණු ලබාගෙන තිබුණි.

## B කොටස

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** ආර්ථික නොවන භාණ්ඩවල ලක්ෂණ පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි.

**(b)** සැලසුම්ගත ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය පැහැදිලි කිරීමට දී තිබූ මෙම ප්‍රශ්නයට සමහර අයදුම්කරුවන් ඉතාමත් පැහැදිලි ලෙස ආර්ථික ගැටළු 3 නම්කර ඒවා සැලසුම්ගත ආර්ථිකයක් විසින් විසඳා ගන්නා ආකාරය ලියා මුළු ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට සමත් විය.

- නමුත් සමහර අයදුම්කරුවන් මූලික ආර්ථික ප්‍රශ්න පමණක් නම්කර ඒවා විසඳා ගන්නා ආකාරය පැහැදිලි කර නොතිබුණි.
- සමහර අයදුම්කරුවන් මූලික ආර්ථික ප්‍රශ්න ලියා පැහැදිලි කර තිබූ අතර සැලසුම්ගත ආර්ථිකයක ඒවා විසඳා ගන්නා ආකාරය ලියා නොතිබුන නිසා මුළු ලකුණු ලබා ගැනීමට අපොහොසත් විය.

**(c)** බොහෝ අයදුම්කරුවන් ශ්‍රමයේ ලක්ෂණ නිවැරදිව සඳහන් කර මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි. අතලොස්සක් අයදුම්කරුවන් මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට ඉදිරිපත් වී නොතිබුණි.

### ප්‍රශ්න අංක 03

**(a)** **(i)** ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඉදිරිපත් කර ප්‍රස්තාරයක් ඇසුරින් සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කිරීමට අසා තිබුණද, ප්‍රස්ථාරය ඇසුරින් විසඳීමට අමතක කර වීජ ගණිතමය ලෙස විසඳා තිබුණි. එමනිසා මුළු ලකුණු ප්‍රමාණය වන ලකුණු හතර ලබාගැනීමට අපොහොසත් විය. දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු සැපයීමට අයදුම්කරුවන් පුහුණු විය යුතුය.

**(ii)** බොහෝ අයදුම්කරුවන් නිෂ්පාදන අතිරික්තය නිවැරදිව ගණනය කර මුළු ලකුණු ලබාගෙන තිබුණි. නමුත් අයදුම්කරුවන් නිෂ්පාදන අතිරික්තය ගණනය කිරීමේදි ඒ සඳහා ඇති සමීකරණය ලියා පියවර වශයෙන් ගණනය කිරීමට අමතක කර ඇත. තවද, ඇතැම් අයදුම්කරුවන් නිෂ්පාදන අතිරික්තය වෙනුවට, පාරිභෝගික අතිරික්තය ගණනය කර තිබුණි.

**(b)** රජය විසින් වක්‍ර බද්දක් පැනවීම නිසා ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ විමසා තිබුණි. භාණ්ඩයක් මත බද්දක් පැනවූ විට එහි නිෂ්පාදන පිරිවැය වැඩිවන බැවින්, සැපයුම අඩු වී සැපයුම් වක්‍රය වමට විතැන් වේ. ඉල්ලුම් වක්‍රය නොවෙනස්ව පවතින අතර,මේ නිසා සමතුලිත ප්‍රමාණය අඩු වී භාණ්ඩයේ සමතුලිත මිල ඉහළ යනු ඇත. තවද, බද්ද පාරිභෝගිකයා සහ නිෂ්පාදකයා විසින් දරාගත යුතු අතර එහි සමාජ පිරිවැයක්ද පවතී. මේ අයුරින් සම්පූර්ණ පැහැදිලි කිරීම කර තිබුණේ අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් පමණි.

**ප්‍රශ්න අංක 04**

**(a)** උද්ධමනය පාලනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග සඳහා අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික තොරතුරු ඇසුරෙන් කරුණු ඉදිරිපත් කර සාර්ථක ලෙස ලකුණු ලබා ගැනීමට සමත් වී ඇත.

**(b)** විද්‍යුත් මුදල් භාවිතා කිරීමේ වාසිද අයදුම්කරුවන් ප්‍රායෝගික දැනුම ඇසුරින් සාර්ථක ලෙස නිවැරදිව දක්වා තිබුණි.

**(c)** ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රමාණාත්මක මූල්‍ය උපකරණ දෙකක් පැහැදිලි කිරීමට අසා තිබුණද බොහෝ අයදුම්කරුවන් පැහැදිලිකර නොතිබුණු අතර කරුණු ඉදිරිපත් කිරීම පමණක් සිදුකර තිබුණි.

අයදුම්කරුවන්ගෙන් ඉතාමත් සුළු පිරිසක් පමණක් අසා ඇති ආකාරයට කරුණු දෙකක් ලියා ඒවා පැහැදිලි කොට මුළු ලකුණු ලබාගෙන තිබුණි.

**ප්‍රශ්න අංක 05**

**(a)** වෙළඳ අනුපාතිකය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉතා අඩු මට්ටමක පැවතිණි. අපනයන ඒකකයක, ආනයන ක්‍රය ශක්තිය යන්න මාරුකර ලියා තිබුණි. අපනයන හා ආනයන අතර අනුපාතයක් ලෙස නිවැරදි නොවන පිළිතුරු ලියා තිබුණි.

අපනයන මිල හා ආනයන මිල අතර අනුපාතය ප්‍රතිශතයක් ආකාරයෙන් දැක්වීම වෙළඳ අනුපාතයයි. බොහෝ අයදුම්කරුවන් 100 න් ගුණ කළ යුතු බව අමතක කර තිබුණි.

**(b)** නිරපේක්ෂ වාසි න්‍යාය යනු, එක් රටක් අනෙක් රටට වඩා කාර්යක්ෂම ලෙස යම් භාණ්ඩයක් නිපදවීම ලෙස අයදුම්කරුවන් නිවැරදිව සඳහන් කර ලකුණු ලබාගෙන තිබුණි..

එනමුත් සමහර අයදුම්කරුවන් නිරපේක්ෂ වාසි න්‍යායට වැරදි සහගත ලෙස ආවස්ථික පිරිවැය ගණනය කර අඩු ආවස්ථික පිරිවැය ඇති රටට නිරපේක්ෂ වාසිය හිමිවේය, යනුවෙන් වැරදි පිළිතුරු ඉදිපත් කර තිබුණි.

**(c)** ප්‍රායෝගිකව වර්තමානයට අදාල කාලීන ප්‍රශ්නයක් වූ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණ වීමෙන් සිදුවන සෘණාත්මක බලපෑම අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග ලෙස ආනායන වියදම අඩු කිරීම හා අපනයන ආදායම වැඩි කිරීම ලෙස ආනයන හා අපනයන පදනම්කරගෙන නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

තවද, දේශීය නිෂ්පාදන කර්මාන්ත නඟාසිටුවීම වැනි පිළිතුරු ද දක්වා තිබීමෙන් ඇතැම් අයදුම්කරුවන්ට මේ පිළිබඳ හොඳ අවබොධයක් පැවති බව දක්නට ලැබුණි.

## C කොටස

**ප්‍රශ්න අංක 06**

**(A) (a) (i)** පෞද්ගලික පරිභෝජන වියදම, රජයේ පරිභෝජන වියදම හා දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය යනාදිය එකතු කර වෙළඳපොල මිලට දළ දේශීය වියදම් ගණනය කිරීම බොහෝ අයදුම්කරුවන් නිවැරදිව සිදුකර තිබුණි.

**(ii)** දළ දේශය වියදමට අපනයන එකතු කර ආනයන අඩු කිරීමෙන්, එනම් ශුද්ධ අපනයන ගැලපීමෙන් දළ දේශිය නිෂ්පාදිතය ගණනය කිරීම බොහෝ අයදුම්කරුවන් නිවැරදිව සිදුකළද අපනයන එකතු කරනවා වෙනුවට ආනයන එකතු කර අපනයන වැරදි ලෙස අඩු කළ අයදුම්කරුවන් ද විය.

**(iii)** දළ දේශීය නිෂ්පාදිතයට, විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම ගැලපීමෙන් දළ ජාතික ආදායම ගණනය කිරීමද බොහෝ අයදුම්කරුවන් නිවැරදිව සිදු කර තිබුණි.

**(b)** ජාතික ගිණුම්වල පවතින සීමාවන් බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ඉදිරිපත් කර මුළු ලකුණු ලබාගෙන ඇත.

**(B)** සෘණ ආර්ථික වර්ධනයක් ඇතිවීමෙන් පැනනගින ප්‍රතිවිපාක සම්බන්ධයෙන් බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස කරුණු ඉදිරිපත් කර ඇත.

**(C)** සාර්ව ආර්ථික අරමුණු තුනක් පැහැදිලි කිරීමට දී ඇති අතර බොහෝ අයදුම්කරුවන්ට මුළු ලකුණු ලබා ගැනීමට නොහැකි වුයේ අරමුණු සඳහන් කළ ද ඒවා පැහැදිලි කිරීම අමතක කර තිබූ නිසාය.

ප්‍රශ්නයේ සඳහන් කළයුතු ක්‍රියාව පිළිබඳව අයදුම්කරුවන් වැඩි අවධානයක් යොමුකළ වුවත් එසේ සිදුකර නොමැති බව පිළිතුරුවලින් ගම්‍ය විය.

- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනිමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවිමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදිමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

- * * * -